# ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව

(රක්ෂණ කර්මාන්තයේ නියාමක)

INSURANCE REGULATORY COMMISSION OF SRI LANKA

# පුරප්පාඩු

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව (IRCSL) පහත පුරප්පාඩුව පිරවීම සඳහා සුදුසුකම් ලත්, ස්වයං අභිප්‍රේරිත කණ්ඩායම් සාමාජිකයින්ට අයදුම් කිරීමට ආරාධනා කරයි:

## රියදුරු/කාර්යාල සහායක තනතුර

### ප්‍රධාන වගකීම්

ප්‍රවාහනය සහ වාහන නඩත්තුව :

- ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ සේවකයින්, අමුත්තන් හෝ භාණ්ඩ ආරක්ෂිතව සහ නියමිත වේලාවට අදාළ ගමනාන්තය වෙත ප්‍රවාහනය කිරීම සහතික කිරීම.
- ආරක්ෂාව සහතික කිරීම සඳහා ගමන් ආරම්භ කිරීමට පෙර සහ පසු දෛනික වාහන පරීක්ෂාවන් සිදු කිරීම සහ යම් යාන්ත්‍රික ගැටළුවක් ඇත්නම් සැපයුම් කළමනාකරු වෙත වාර්තා කිරීම.
- වාහනවල පිරිසිදුකම පවත්වා ගැනීම සහ අවශ්‍ය පරිදි ඉන්ධන පිරවීම මගින් වාහන සෑම විටම ප්‍රශස්ත ක්‍රියාකාරී තත්ත්වයක පවතින බව සහතික කිරීම;

කාර්යාල පරිපාලනය සහ වාර්තා කළමනාකරණය :

- වාර්තා කළමනාකරණ පද්ධතිය පවත්වාගෙන යාම සඳහා සහාය වීම.
- නියමිත වේලාවට කාර්යාලය විවෘත කිරීම සහ වසා දැමීමේ ප්‍රධාන රාජකාරිය ඉටු කිරීම.
- කාර්යාලයේ නඩත්තු කටයුතු සහ එහි පිරිසිදුකම පවත්වා ගැනීම සඳහා පරිපාලන අංශයට සහාය වීම.

### ප්‍රධාන සුදුසුකම්

- අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයෙන් සම්මාන සාමාර්ථ 3ක් සහිතව විෂයයන් 6ක් සමත් වී තිබීම,

සහ

- වලංගු බර වාහන රියදුරු බලපත්‍රයක් සහිතව රියදුරෙකු ලෙස වසර පහක (05) පළපුරුද්දක් තිබීම.

### පොදු කොන්දේසි

- අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 40 ට අඩු විය යුතුය (රාජ්‍ය අංශයේ අයදුම්කරුවන් සඳහා මෙය අදාළ නොවේ).
- තම සුදුසුකම් පැහැදිලිව තහවුරු කරන අයදුම්කරුවන් කෙටි ලැයිස්තුගත කර ඒ බව දැනුම් දෙනු ලැබේ.
- ඕනෑම ආකාරයක බලපෑම් කිරීමක් නුසුදුසුකමක් ලෙස සැලකේ.

### වැටුප් සහ ප්‍රතිලාභ

- දළ වැටුප **රු. 78,425.00** ක් සහ මසකට **රු. 2,000.00** ක හිල ඇඳුම් දීමනාවක්.

### වෙනත් ප්‍රතිලාභ

- වාර්ෂික කාර්යසාධනය මත පදනම් වූ දිරි දීමනා
- භාවිතා නොකළ නිවාඩු සඳහා මුදල් ලබා ගැනීම
- බාහිර රෝගී වෛද්‍ය වියදම් ආපසු ගෙවීම්
- පූර්ණ නේවාසික වෛද්‍ය රක්ෂණයක්
- ජීවිත සහ බරපතල රෝගාබාධ සඳහා රක්ෂණාවරණයක්
- මාස 60ක මූලික වැටුපට සමාන පුද්ගලික හදිසි අනතුරු රක්ෂණාවරණයක්
- වාහන සහ ආපදා ණය පහසුකම්
- උසස් අධ්‍යාපනය සඳහා අනුග්‍රහය
- එක් වෘත්තීය ආයතනයක් සඳහා සාමාජික ගාස්තු ආපසු ගෙවීම

ඉහත **සුදුසුකම් සනාථ කරන සහතිකපත්වල පිටපත්,** රියදුරු බලපත්‍රයේ පිටපතක් සහ ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ සම්බන්ධතා තොරතුරු ඇතුළත් අයදුම්පත, ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ "රියදුරු/කාර්යාල සහායක තනතුර" ලෙස සඳහන් කර **2026 ජූනි 08** වන දින හෝ ඊට පෙර පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

අයදුම් කිරීමේ ක්‍රියාවලිය පිළිබඳව ඔබට තවදුරටත් තොරතුරු අවශ්‍ය නම්, කරුණාකර **011 239 6184/ 9** ඔස්සේ පරිපාලන අංශය අමතන්න.

**අධ්‍යක්ෂ ජනරාල්**

**ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව**

**11 වන මහල, නැගෙනහිර කුළුණ, ලෝක වෙළඳ මධ්‍යස්ථානය, කොළඹ 01.**

**වෙබ් අඩවිය: www.ircsl.gov.lk**

SELACINE